නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

சட்ட வரைஞர் திணைக்களம்

Legal Draftsman's Department

..

2018

කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම

මෙහෙවර

ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම

හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තුව අංක 1897/15 හා 2015.01.18 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය අනුව අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට පත් වූ අතර, අංක 1933/13 හා 2015.09.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරයි.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ලිඛිත නීති බවට පරිවර්තනය කිරීම වේ. එසේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේදී, දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සිදුකරයි. පනත් කෙටුම්පත් සමාලෝචනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනෙකුත් රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළුව ආණ්ඩුවේ සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ උපකාරක නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් ආණ්ඩුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

1. පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වනුයේ :-

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) උපකාරක නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවලදී) උපකාරක නීති කෙටුම්පත් කිරීම

(3) නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම

(4) අවශ්‍ය අවස්ථාවල දී පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම

(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

පනත්, උපකාරක නීති, සහ පළාත් සභා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීමේදී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, ආණ්ඩුවේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදන අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුද්‍රා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

2. කාර්ය මණ්ඩලය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය පහත සඳහන් පරිදි වේ. අනුමත ඒකාබද්ධ කාර්ය මණ්ඩලය 148 ක් වන අතර 2018.12.31 වන දිනට සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය 98 ක් වේ.

තනතුරු වර්ග	අනුමත කාර්ය මණ්ඩලය	සේවයේ නියුතුව සිටින කාර්ය මණ්ඩලය
ජ්‍යෙෂ්ඨ මට්ටම	**42**	**29**
තෘතීය මට්ටම	**28**	**13**
ද්විතීය මට්ටම	**54**	**40**
ප්‍රාථමික මට්ටම	**24**	**16**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය											
ජ්‍යෙෂ්ඨ මට්ටම			තෘතීය මට්ටම			ද්විතීය මට්ටම			ප්‍රාථමික මට්ටම		
	අනුමත	තත්‍ය		අනුමත	තත්‍ය		අනුමත	තත්‍ය		අනුමත	තත්‍ය
නීති කෙටුම්පත් සම්පාදක	01	01	පරිපාලන නිලධාරි	01	01 (කොන්ත්‍රාත්)	සංවර්ධන සහකාර	02	-	රියදුරු	10	08
අතිරේක නීති කෙටුම්පත් සම්පාදක	01	01	ප්‍රධාන භාෂා පරිවර්තක	02	01	පුස්තකාලයාධිපති	01	01	කාර්යාල කාර්ය සහායක	14	08
නියෝජ්‍ය නීතිකෙටුම්පත් සම්පාදක	05	05	භාෂා පරිවර්තක	24	10	රාජ්‍ය කළමනාකරණ සහකාර	20	19			
ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක	08	01	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	01	01	ලේඛන සහකාර	20	13			
සහකාර නීති කෙටුම්පත් සම්පාදක	25	20				සංස්කාරක	11	07			
ප්‍රධාන ගණකාධිකාරී	01	01									
සහකාරඅධ්‍යක්ෂ	01	-									
එකතුව	42	29		28	13		54	40		24	16
මුළු එකතුව				අනුමත ගණන 148			තත්‍ය ගණන 98				

කාර්ය මණ්ඩල තොරතුරු (2018.12.31 දිනට)

සේවක කාණ්ඩ මට්ටම	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය			දැනට සිටින කාර්ය මණ්ඩලය		
		ස්ථිර	අනියම්	කෝන්ත්‍රාත්	ස්ථිර	අනියම්	කොන්ත්‍රාත්
ජ්‍යෙෂ්ඨ මට්ටම	නීති කෙටුම්පත් සම්පාදක	01	-	-	01	-	-
-එම-	අතිරේක නීති කෙටුම්පත් සම්පාදක	01	-	-	01	-	-
-එම-	නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක	05	-	-	05	-	-
-එම-	ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක	08	-	-	01	-	-
-එම-	සහකාර නීති කෙටුම්පත් සම්පාදක	25	-	-	20	-	-
-එම-	ප්‍රධාන ගණකාධිකාරී	01	-	-	01	-	-
-එම-	සහකාර අධ්‍යක්ෂ	01	-	-	-	-	-
තෘතීය මට්ටම	පරිපාලන නිලධාරී	01	-	-	-	-	01
-එම-	ප්‍රධාන භාෂා පරිවර්තක	02	-	-	01	-	-
-එම-	භාෂා පරිවර්තක	24	-	-	10	-	-
-එම-	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	01	-	-	01	-	-
ද්විතීය මට්ටම	පුස්තකාලයාධිපති	01	-	-	01	-	-
-එම-	සංවර්ධන සහකාර	02	-	-	-	-	-
-එම-	රාජ්‍ය කළමනාකරණ සහකාර	20	-	-	19	-	-
-එම-	ලේඛන සහකාර	20	-	-	13	-	-
-එම-	සංස්කාරක	11	-	-	07	-	-
ප්‍රාථමික මට්ටම	රියදුරු	10	-	-	08	-	-
-එම-	කාර්යාල සේවක සේවය	14	-	-	08	-	-

මෙයට අමතරව උපදේශක නිලධාරීන් තුන් දෙනෙක් (03) කොන්ත්‍රාත් අපදනම මත සේවය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යභාරය ඉටුකිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 148 කි. එසේ වුව ද එකී කාර්යභාරය ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව 98 ක් පමණි. මෙහි පහත දක්වා ඇති පරිදි විවිධ සේවා ගණවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 50 ක් ඇත :-

ජ්‍යෙෂ්ඨ මට්ටම

(අ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 07 ක් පුරප්පාඩුව පවතී. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලත් එනම්, වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් නොමැති බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට දැනට සිටින සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් අදාළ සේවා කාලය සම්පූර්ණ කළ යුතු ය.

(ආ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු 05 ක් ඇත. එම පුරප්පාඩු පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2017.09.21 දිනැතිව අනුමතිය ලැබී ඇත. එහෙත් එම පුරප්පාඩු පිරවීමට පෙර අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කළයුතු බැවින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) සහකාර අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත.

තෘතීය මට්ටම

(අ) පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. කොන්ත්‍රාත් පදනම මත 2017.05.01 දින බඳවාගත් නිලධාරිනියක් දැනට සේවයේ නියුතුව ඇත. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත.

(ආ) භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2016.09.04 දින ලිඛිත විභාගයක් පවත්වන ලදී. සිංහල/දෙමළ අයදුම්කරුවන් 16 දෙනෙකු විභාගය සමත්ව තිබූ අතර සුදුසුකම්ලත් අයගෙන් සිංහල මාධ්‍ය සඳහා 10 දෙනෙකු සහ දෙමළ මාධ්‍ය සඳහා 03 දෙනෙකු 2016.12.01 දින වැඩ භාර ගන්නා ලදී. ඒ අනුව 2018.12.31 දින වන විට පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් වේ.

ඉංග්‍රීසි/සිංහල භාෂා පරිවර්තක තනතුරු - 06 ක් සහ

ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තක තනතුරු - 08 ක් වේ.

වැටුප් ක්‍රමයේ පවතින දුර්වලතා නිසා මෙම නිලධාරීන් සේවයේ රඳවා ගැනීම අපහසුව ඇත. ඒ අනුව මෙම තනතුරු සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කළ යුතුව ඇති බැවින් ඒ සඳහා වැටුප් ක්‍රමය සංශෝධනය කර නිර්දේශ සමග අනුමැතිය සඳහා අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

<u>ද්විතීය මට්ටම</u>

(අ) සංවර්ධන සහකාර නිලධාරීන් දෙදෙනෙකු ලබාදෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

(ආ) 2018.12.31 දිනට ලේඛන සහකාර තනතුරෙහි පුරප්පාඩු 07 ක් හා සංස්කාරක තනතුරෙහි පුරප්පාඩු 04 ක් පවතී. 2014 වසරෙහි ලිඛිත විභාගයක් පවත්වා එහි ප්‍රතිඵල මත පළමු වරට 2014.12.01 දින ලේඛන සහකාර තනතුරු 10 ක් සහ සංස්කාරක තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීම සිදුකළ අතර 2016 වසර වන විට නැවතත් පුරප්පාඩු ඇති වූ බැවින් ඉහත විභාග ප්‍රතිඵල මතම දෙවන වරටත් 2016.08.23 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එම ප්‍රතිඵල මත 2016.09.15 දින ලේඛන සහකාර 08 දෙනෙක් සහ සංස්කාරක 08 දෙනෙක් බඳවා ගන්නා ලදී. මේ වන විට එම පිරිසෙන් ද ලේඛන සහකාර තනතුරු 01 ක් සහ සංස්කාරක තනතුරු 02 ක් හැර ගොස් තිබේ. වැටුප් ක්‍රමයේ පවතින දුර්වලතා නිසා සේවයේ රඳවා ගැනීමට අපහසුතාවයක් පවතී.

<u>ප්‍රාථමික මට්ටම</u>

(අ) රියදුරු සේවයේ පුරප්පාඩු 02 ක් පවතී. පුරප්පාඩු සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

(ආ) කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු 06 ක් පවතී. එම පුරප්පාඩු සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

3. දෙපාර්තමේන්තුවේ අංශ

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යය පහත සඳහන් අංශ මගින් ක්‍රියාත්මක වේ.

නීති කෙටුම්පත් සම්පාදන අංශය
ආයතන හා පාලන අංශය
භාෂා පරිවර්තන අංශය
ප්‍රකාශන අංශය
ගිණුම් අංශය

නීති කෙටුම්පත් සම්පාදන අංශය

ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් ៖-

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම.
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- ආණ්ඩුවේ නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී නෛතික උපදෙස් ලබා දීම.
- නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

කාර්ය සාධන වාර්තාව - **2018.01.01 – 2018.12.31**

	(1)	(2)	(3)	(4)	(5)	(6)	(7)	(8)	(9)	(10)
	රාජකාරියේ ස්වභාවය	**2018.01.01**දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙන ආ ශේෂය)	**2018.01.01** දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙන ආ ශේෂය)	මෙම වර්ෂය තුළ පාර්ශ්වයන් වෙතින් ලැබුණු නව ඉල්ලීම් සංඛ්‍යාව	පසුගිය වර්ෂ වල හා මෙම වර්ෂයේදී භාෂාත්‍රයෙන් කෙටුම්පත් කර අවසන් කර එහෙත් නැවත වරක් සංශෝධන සිදුකිරීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව	එකතුව	**2018.12.31** දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශ්වයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිහිපවරක් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශ්වයන් වෙත භාරදුන් අවසන් කෙටුම්පත්වල ඒ ඒ වාරයන් සියල්ලම මෙහි ඇතුළත් වේ.)	දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු	**2018.12.31** දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව	**2018.12.31** දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව
1.	පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති)	**156**	**10**	**70**	**12**	**248**	**60**	**10**	**167**	**11**
2	පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්	**130**		**7**		**137**	**1**	**-**	**136**	
3	උපකාරක නීති ප්‍රතිශෝධනය	**126**	**31**	**185**	**19**	**361**	**167**	**-**	**163**	**31**
4	පළාත් සභා ප්‍රඥප්ති	**8**	**1**	**-**	-	**9**	**1**	**-**	**7**	**1**

පැහැදිලි කිරීම

මෙම දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමුකර සම්පූර්ණ කරනු ලැබ කෙටුම්පත් යවනු ලැබූවා වූ ඉල්ලීමක්, ප්‍රධාන වශයෙන් උපදෙස් ලබාදෙනු ලබන නියෝජ්‍යායතන විසින් තම ප්‍රතිපත්තිය නිරන්තරයෙන් වෙනස් කිරීමේ හේතුව මත, තවදුරටත් වූ සංශෝධන සඳහා අලුත් උපදෙස් ද සමග ඉදිරිපත් කරනු ලැබේ. එසේ වුවද එවැනි ඉල්ලීමක් ලැබුන විට එම ඉල්ලීමට අදාළ කෙටුම්පත අවසාන වශයෙන් සකස් කර තිබීම නොසලකා අලුතින් සිදුකරනු ලබන ඉල්ලීමක් සඳහා මෙන් එම ඉල්ලීම පිළිබඳව නැවත අවධානය යොමු කිරීමට හා කාලය වැය කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදු වේ. වැඩිදුරටත්, සම්පූර්ණ කරන ලද කෙටුම්පත් සඳහා එවැනි සංශෝධන සිදුකිරීමට කරනු ලබන ඉල්ලීම් අවසාන කෙටුම්පත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුව ද සිදු කරනු ලබන අතර ඇතැම්විට එම කාර්ය පටිපාටිය නැවත නැවතත් වාර ගණනක් ඉටු කිරීමට සිදු වේ. පහතින් ඒ සඳහා නිදසුන් ඉදිරිපත් කර ඇත.

පනත් කෙටුම්පතේ නම	කෙටුම්පත් යවා ඇති වාර ගණන (2018.12.31 දිනට)
රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත	22
ඉඩම් බැංකු පිහිටුවීමේ පනත් කෙටුම්පත	26
ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත	16
ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල (සංශෝධන)පනත් කෙටුම්පත	14
ස්වේච්ඡා සමාජ සේවා (ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණය කිරීමේ සංශෝධිත) (සංශෝධන) පනත් කෙටුම්පත	13
ජාතික අක්ෂි බැංකු පනත් කෙටුම්පත	14

එහෙයින්, මෙම දෙපාර්තමේන්තුව විසින් යම් ඉල්ලීමක් සඳහා අවධානය යොමුකර එය සම්පූර්ණ කර තිබුණ ද ඉහත හේතුව මත එම ඉල්ලීම තවදුරටත් මෙම දෙපාර්තමේන්තුව විසින් "කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීමක්" වශයෙන් පෙන්නුම් කරනු ලැබේ.

<u>පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්</u>

අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ උපදෙස් පරිදි විගණන පනත, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ පනත සම්මත වන තෙක් පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් (වෘත්තීමය ආයතනයන්හි පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ පනත්) කෙටුම්පත් හැර) සම්බන්ධ කටයුතු නැවත අප වෙත දන්වන තුරු තාවකාලිකව නතර කර ඇත. එම හේතුව නිසා 2018.12.31 දින වනවිට පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් කිරීම අවසන් නොවී නවතා ඇති ප්‍රමාණය 136 කි.

<u>පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති)</u>

පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති) අවසන් නොවූ ඉල්ලීම් 11 කි. අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ හෝ අවශ්‍ය කැබිනට් අනුමතය ලැබී නොමැති හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

<u>උපකාරක නීති ප්‍රතිශෝධනය</u>

උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව 31 කි. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ හෝ අවශ්‍ය වන හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

ආයතන අංශය හා පාලන අංශය

ආයතන හා පාලන අංශය මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විනය කටයුතු, ප්‍රවාහන පහසුකම් හා සම්බන්ධ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලු ආයතනික හා පරිපාලන කටයුතු ඉටු කරනු ලබයි.

1. පුහුණු කිරීම්

දේශීය පුහුණු කිරීම්

දේශීය පුහුණු කිරීම් පහත දක්වා ඇති පරිදි නිලධාරීන්ට ලබාදෙන ලදි.

ආයතනය	තනතුර	සහභාගී වූ නිලධාරීන් ගණන	පාඨමාලාව
උසස් නීති අධ්‍යයන ආයතනය	සහකාර නීති කෙටුම්පත් සම්පාදක	01	සමාගම් නීතිය පිළිබඳ පශ්චාත් නීති ඩිප්ලෝමාව
ශ්‍රී ලංකා පදනම ආයතනය	නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක	01	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ වැඩමුළුව
බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය	පුස්තකාලයාධිපති	01	තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධව පුස්තකාලයාධිපතිවරයෙකුගේ භූමිකාව සහ දායකත්වය පිළිබඳ වැඩමුළුව
පුස්තකාල සංගමය	පුස්තකාලයාධිපති	01	පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ජාතික සමුළුව
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය	පුස්තකාලයාධිපති	01	ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හා දෙපාර්තමේන්තු වල වෘත්තීය ප්‍රවීණයන් සහ කළමනාකරණ ප්‍රධානීන් සඳහා වූ ඊ-ගවර්න්මන්ට්, සයිබර් ආරක්ෂණය හා සමාජ මාධ්‍යය පිළිබඳ සම්මන්ත්‍රණය
	රාජ්‍ය කළමනාකරණ සහකාර	01	රජයේ පරිගණකගත පඩිපත් පද්ධතිය
	රාජ්‍ය කළමනාකරණ සහකාර	01	රාජ්‍ය මූල්‍ය රෙගුලාසි
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	රාජ්‍ය කළමනාකරණ සහකාර	01	නවක කළමනාකරණ සහකාරවරුන්ගේ වෘත්තීය සංවර්ධනය

ප්‍රාග් ඉන්ස්ටිටියුට්	රාජ්‍ය කළමනාකරණ සහකාර	02	නව බදු නීති, රඳවාගැනීම් හා ප්‍රාග්ධන ලාභ
නිපුණතා සංවර්ධන අරමුදල	රාජ්‍ය කළමනාකරණ සහකාර	01	අලාභ වාර්තා කිරීම, හානි පූර්ණය හා කපා හැරීම පිළිබඳ දෙදින වැඩමුළුව

විදේශීය පුහුණු කිරීම් හා සම්මන්ත්‍රණ

නිළධාරියාගේ නම සහ තනතුර	පුහුණුවීම/ සම්මන්ත්‍රණය	රට
ඩී.එස්.එච්. කුමාරජීව මිය නීති කෙටුම්පත් සම්පාදක	Study tour on Introducing amendments to the commission to investigation of Bribery.	හොංකොං
ඩී.එස්.එච්. කුමාරජීව මිය නීති කෙටුම්පත් සම්පාදක	The Financial Actional Task Force-APJG	තායිලන්තය
එස්.එස්.එම්.ඩී.ඊ. වීරකෝන් මිය නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක	Bali Process Working Group on Trafficking in Persons Events	තායිලන්තය
බී.කේ.එන්.ද සිල්වා මිය සහකාර නීති කෙටුම්පත් සම්පාදක	International Legislative Drafting Course-2018	ඇ.එ.ජ.
ජී.කේ.හේවාවිතාන මයා සහකාර නීති කෙටුම්පත් සම්පාදක	International Legislative Drafting Course-2018	ඇ.එ.ජ.
වී.එල්.දයාරත්න මෙය සහකාර නීති කෙටුම්පත් සම්පාදක	International Legislative Drafting Course – 2018	ඇ.එ.ජ.
සී.බී.කපුරුබණ්ඩාර මිය සහකාර නීති කෙටුම්පත් සම්පාදක	IALS Legislative Drafting Course – 2018	එ.රාජධානිය
ජී.ඒ.එස්. ක්‍රිෂාන්ති මිය සහකාර නීති කෙටුම්පත් සම්පාදක	IALS Legislative Drafting Course – 2018	එ.රාජධානිය
යූ.එම්.සපුකොටන මිය සහකාර නීති කෙටුම්පත් සම්පාදක	IALS Legislative Drafting Course – 2018	එ.රාජධානිය
එල්.ජී. පුංචිහේවා මිය සහකාර නීති කෙටුම්පත් සම්පාදක	IALS Legislative Drafting Course – 2018	එ.රාජධානිය
ඩී.ඩී. වීරක්කොඩි මිය ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක	Exposure visit to Vietnam	වියට්නාමය

ඩී.ඩී. කුලසේන මෙනවිය නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක	4th Training session of China and (AALCO)	චීනය
ඩී.එස්.එච්. කුමාරජීව මිය නීති කෙටුම්පත් සම්පාදක	Asia Pacific Joint Group Review - 3rd Face to Face Meeting	ඉන්දුනීසියාව
එස්. සෙල්වකුණපාලන් මයා නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක	2018 Advanced Legislative Drafting	ඇ.එ.ජ.
එස්.එස්.එම්.ඩී.ඊ. වීරකෝන් මිය නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක	2018 Advanced Legislative Drafting	ඇ.එ.ජ.
කේ.ආර්. වයි. හපුආරච්චි මිය අතිරේක නීති කෙටුම්පත් සම්පාදක	WTO Panel Report on Australia's Tobacco Plain Packaging Laws	ඔස්ට්‍රේලියාව
යූ. ගුනියන්ගොඩ මෙය සහකාර නීති කෙටුම්පත් සම්පාදක	Legal aspects of international Financial Institutions	සිංගප්පූරුව
ටී.ඒ.වයි.එම්.රණවන නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක	Cyber Security Studies (PCSS) Resident Course	ජර්මනිය
ටී.ටී.එන්. ප්‍රනාන්දු ප්‍රධාන ගණකාධිකාරී	International Program on Management University of Gadjah. Mada,	ඉන්දුනීසියාව

2. අනෙකුත් ආයතනික හා පරිපාලන කටයුතු

i. දේශීය හා විදේශීය නීතිමය තත්ත්වයන්ගේ නව වර්ධනයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම උදෙසා සහ ඒ පිළිබඳව ඔවුන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ද උදෙසා දෙපාර්තමේන්තුවේ 1 වන ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිත කොට ඇති අතර, 2018 වර්ෂයේ දේශීය හා විදේශීය පොත් 71 ක් මිලදී ගෙන ඇත.

ii. සේවක සුභසාධනය වෙනුවෙන් පොදු සුභසාධක සංගමයක් පවතී. එමගින් 2018 වර්ෂයේදී, සාමාජිකයන් සඳහා ණය පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩල අතර සුහදතාවය වර්ධනය කිරීම උදෙසා සංස්කෘතික උත්සව සහ අධ්‍යාත්මික වර්ධනය සඳහා ආගමික උත්සව පැවැත්වීම දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩල සඳහා කුඩා පුස්තකාලයක් පවත්වාගෙන යාම ආදිය සිදු කරන ලදී.

iii. නීති නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් නීති නිලධාරීන්ගේ සංගමයක් ද ඇත. නීති නිලධාරීන්ගේ වෘත්තිමය නිපුණතා වර්ධනය මෙන්ම අනෙකුත් සුභසාධන කටයුතු මෙම සංගමය මගින් ඉටු කරයි.

භාෂා පරිවර්තන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් ඉංග්‍රීසි බසින් සකස් කරනු ලබන නීති කෙටුම්පත් (නව නීති සහ සංශෝධන නීති) සහ ප්‍රතිශෝධනය කරනු ලබන උපකාරක නීති, අදාළ රාජ්‍ය භාෂාවලට පරිවර්තනය කිරීම ද දෙපාර්තමේන්තුවේ ආයතන, පාලන සහ ගිණුම් අංශවල රාජකාරි ලිපිලේඛන අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම ද භාෂා පරිවර්තන අංශය මගින් සිදු කරනු ලබයි.

ප්‍රකාශන අංශය

පනත් කෙටුම්පත් හා උපකාරක නීතිවල ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ පිටපත්වල සෝදුපත් බැලීම, පරීක්ෂා කිරීම ද පාර්ලිමේන්තුව හා රජයේ මුද්‍රණාලය විසින් එවනු ලබන පනත් කෙටුම්පත්වල අත් පිටපත් හා ගුරු පිටපත් කියවා බැලීම ද නීති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ එවැනි පිටපත් හා සම්බන්ධ සංස්කරණ කටයුතු සිදු කිරීම කරන අතරවාරයේ දී දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම ද, පනත් ගැසට් පත්‍රයේ පළකිරීමට පියවර ගැනීම යනාදී කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම ද මෙම අංශය මගින් සිදුකරනු ලබයි. එසේම නීති සම්පාදනයට අදාළ වන සියලුම ලිපිගොනු නීති නිලධරයන්හට බෙදාහැරීම ද මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ගිණුම් අංශය

230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

2018.01.01 – 2018.12.31

වැය විස්තරය

ශීර්ෂය : 230 - නීති කෙටුම්පත් සම්පාදක
වැඩ සටහන : 01 මෙහෙයුම්
ව්‍යාපෘතිය : 01 සාමාන්‍ය පරිපාලනය හා නීති කෙටුම්පත් කිරීම

2018.01.01 සිට 2018.12.31 දක්වා පුනරාවර්තන වියදම්

පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	අයවැය ප්‍රතිපාදන (රු.)	අමතර ප්‍රතිපාදන (රු.)	මු.රෙ. 66 අනුව මාරු කිරීම්	ශුද්ධ ප්‍රතිපාදන (රු.)	මුලු වියදම් (රු.)	මූල්‍ය ප්‍රගතිය
පුද්ගල පඩිනඩි	75,750,000.00	19,000,000.00	34,000.00	94,784,000.00	91,677,183.24	96.72%
අනෙකුත් වියදම්	27,042,000.00	700,000.00	-34,000.00	27,708,000.00	27,205,389.29	98.19%
පුනරාවර්තන වියදම්වල එකතුව	102,792,000.00	19,700,000.00	0.00	122,492,000.00	118,882,572.53	97.05%

2018.01.01 සිය 2018.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	අයවැය ප්‍රතිපාදන (රු.)	අමතර ප්‍රතිපාදන (රු.)	මු.රෙ. 66 අනුව මාරු කිරීම්	ශුද්ධ ප්‍රතිපාදන (රු.)	මුලු වියදම් (රු.)	මූල්‍ය ප්‍රගතිය
<u>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u> 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,500,000.00		563,000.00	2,063,000.00	2,062,709.00	99.99%
<u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> 2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	700,000.00		90,000.00	790,000.00	789,533.75	99.94%
<u>හැකියා වර්ධනය</u> 2401 - කාර්ය මණ්ඩල පුහුණු	30,000,000.00			30,000,000.00	26,976,633.28	89.92%
<u>වෙනත් මූලධන වියදම්</u> 2501 - ප්‍රතිව්‍යුහගතකිරීම් - ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම	4,000,000.00		-653,000.00	3,347,000.00	1,006,031.25	30.06%
2506 - යටිතල පහසුකම් සංවර්ධනය-නීති ග්‍රන්ථ මිලදී ගැනීම	2,000,000.00			2,000,000.00	436,679.00	21.83%
ප්‍රාග්ධන වියදම්වල එකතුව	**38,200,000.00**		**0.00**	**38,200,000.00**	**31,271,586.28**	**81.86%**

2018.01.01 සිට 2018.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය

විස්තරය	2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2018.12.31 දිනට වියදම (රු.මි.)	2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය %
පුනරාවර්තන වියදම	122.492	118.883	97.05%
ප්‍රාග්ධන වියදම	38.2	31.272	81.86%
එකතුව	160.692	150.155	93.44%

ඒසීඒ-එෆ්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2018		සටහන	තතය 2018	2017	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		150,755,657	133,994,308.28	ඒසීඒ-3
-	තැන්පතු		37,980	221,981.17	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,810,307	4,129,185.00	ඒසීඒ-5/5(ඒ)
-	වෙනත් ලැබීම්		4,889,048	2,580,367.58	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**161,492,992**	**140,925,842.03**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**161,492,992**	**140,925,842.03**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
75,750,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	91,677,182	70,498,473.18	ඒසීඒ-2(ii)
24,542,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	24,835,971	24,285,916.65	
2,500,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,369,420	920,779.15	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
102,792,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**118,882,573**	**95,705,168.98**	
	මූලධන වියදම්				
1,500,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	2,062,709	-	ඒසීඒ-2(ii)
700,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	789,534	551,964.83	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
30,000,000.00	හැකියා වර්ධනය	14	26,976,633	20,998,462.03	
6,000,000.00	වෙනත් මූලධන වියදම්	15	1,442,710	7,190,235.76	
38,200,000.00	**මුළු මූලධන වියදම් (ඉ)**		**31,271,586**	**28,740,662.62**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**4,986,725**	**6,524,585.17**	
	තැන්පතු ගෙවීම්		30,880	1,585,296.17	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,955,845	4,939,289.00	ඒසීඒ-5/5(ඒ)
	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		**155,140,884**	**130,970,416.77**	
-	**2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**6,352,108**	**9,955,425.26**	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JPA/B/LDD/02/2018/45(I)   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2019 ජුනි 12 දින

13 JUN 2019

නීති කෙටුම්පත් සම්පාදක

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව.

ශීර්ෂය - 230, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

කේ.කේ.වී. ධර්මසිරි.
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	JPA/B/LDD/02/ 2018/45(i)	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2019 ජූනි 12 දින.

නීති කෙටුම්පත් සම්පාදක (ගණන්දීමේ නිලධාරී)

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය</u>

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිරිදේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂයක් පෙන්නුම් නොකළද, මූල්‍ය ප්‍රකාශයන් හි ඇතුලත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මුදල් වල ශුද්ධ වෙනස්වීම් යටතේ 2018 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු. 1,122,073 ක් ලෙස දක්වා තිබුණි. එසේම මෙම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වැය කිරීම යටතේ මූල්‍ය පිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ලෙස දක්වා නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(i) ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය.	පවත්වා නොතිබුණි.
(ii) හානි පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව හානි හා පාඩු විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වා ගත යුතුය.	යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

2 - මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

2.1.1 ප්‍රතිපාදන ඌන උපයෝජනය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.36,983,000 කින් රු.7,064,027 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 07 සිට සියයට 78 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

2.1.2 ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම ඇස්තමේන්තුවට අදාල කෙටුම්පත් ඇස්තමේන්තු රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවතර්තන වැය විෂයයන් 18 කින් පුනවරාවර්තන වැය විෂයයන් 06 ක් වෙත සලසා තිබුණු රු. 1,638,500 ක ප්‍රතිපාදනය වෙනත් පුනරාවර්තන වැය විෂයන් 07 ක් වෙත අවස්ථා 07 කදී මාරු කර තිබූ බැවින්ද, සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු සමස්ත මූලධන වැය විෂයයන් 05 කින් මූලධන වැය විෂයන් 01 ක් වෙත සලසා තිබුණු රු. 653,000 ක ප්‍රතිපාදන වෙනත් මූලධන වැය විෂයන් 02 ක් වෙත අවස්ථා 02 කදී මාරු කර තිබූ බැවින්ද, පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. 19,700,000 ක අමතර ප්‍රතිපාදන සලසා තිබුණු බැවින්ද, ඉහතින් සඳහන් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2.2.1 භාණ්ඩාගාරය විසින් නිකුත් කල බැරකම් ප්‍රකාශයට සමාන නොවීම

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.4 ඡේදයේ විධි විධාන ප්‍රකාර සටහන අංක iii හි යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම ශිර්ෂය වලට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ වියයුතු වුවද ශිර්ෂ අංක 230 ට අදාල භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ බැරකම් පිළිබඳ ලේඛනයේ බැරකමේ වටිනාකම වූ රු.3,787,242 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක (iii) දක්වා ඇති වටිනාකම රු.1,200,101 ක් වූයෙන් වෙනස රු.2,587,141 ක් විය.

2.2.2 තවදුරටත් නිරවුල් නොකල බැරකම් හෝ මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් (iii) ඇතුලත් 2018 දෙසැම්බර් දුම්රිය බලපත්‍ර ගාස්තු රු. 4,940 ක් බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

2.3 <u>නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම</u>

නීති රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
මුදල් රෙගුලාසි 104 (3) / 104(4)	පාඩු හා හානි සම්බන්ධයෙන් පරිපූරන වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වැඩි ප්‍රමාදයක් සිදු වේ නම් මුදල් රෙගුලාසි 104 (03) ප්‍රකාර හානියේ ස්වාභාවය හා ප්‍රමාණය ඊට හේතුව, ඊට සම්බන්ධ නිලධාරීන්ගේ නම තනතුර සහ පවත්වාගෙන යනු ලබන විමර්ශනයේ ස්වරූපය දක්වා ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සිදු වී තිබූ වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. එසේම පරීක්ෂණයෙන් පසු අලාභ හානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

3 - මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

දෙපාර්තමේන්තුවේ 2018 කාර්යසාධන වාර්තාවේ සටහනට අනුව 2018 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් කිරීම සඳහා වූ මුළු ඉල්ලීම්, පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) - 248, පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් - 137, උපකාරක නීති ප්‍රතිශෝධනය - 361 හා පළාත් සභා ප්‍රඥාප්ති සකස් කිරීම 09 ක් වශයෙන් විය. එම දිනට තවදුරටත් නීති කෙටුම්පත් කිරීමේ කටයුතු අවසන් නොවී නීති කෙටුම්පත් සම්පාදක වෙත රැඳී තිබූ ඉල්ලීම් ප්‍රමාණය පිළිවෙලින්, පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) - 11, උපකාරක නීති ප්‍රතිශෝධනය - 31 හා පළාත් සභා ප්‍රඥාප්ති සකස් කිරීම 01 ක් වශයෙන් විය. කෙසේ වෙතත් තවදුරටත් 2018 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නීතිපති හෝ අනිකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් පිළිවෙලින්, පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) - 167, පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් - 136, උපකාරක නීති ප්‍රතිශෝධනය - 163 හා පළාත් සභා ප්‍රඥාප්ති සකස් කිරීම 07 ක් වශයෙන් විය. මෙසේ නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් බාහිර පර්ශවයන් වෙත රැඳි ඉල්ලීම් සංඛ්‍යාව මුළු ඉල්ලීම් වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 67 සියයට 99 සියයට 45 හා සියයට 77 ක් වූයෙන් තමාට සීමා වූ වැඩසටහනක් නොමැති දෙපාර්තමේන්තුවක් වූ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි එම කරුණ සෘජුවම බලපා තිබුණි.

3.2 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවද, 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයෙන් හා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ පහත අවශ්‍යතා ඉටු කර නොතිබුණු නිසා එම ක්‍රියාකාරී සැලැස්ම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කර තිබුණු ආයතනයේ සංවිධාන ව්‍යුහය

අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය

(ii) සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Action Plan)

(iii) ක්‍රියාත්මක කළයුතු කාල රාමුව (Time Line)

(iv) ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Out Put/ Out Come) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(v) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan)

3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

රු. මිලියන 185 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සහිතව නීති ප්‍රඥප්ති ඒකාබද්ධ කොට ප්‍රතිශෝධනය කිරීමේ ව්‍යාපෘතිය 2014 ජූලි 01 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට නියමිතව තිබුණද එසේ නිම කර නොතිබුණි.

කෙසේ වුවද 2018 පෙබරවාරි 27 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට හා අංක 18/0427/731/008 වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාලව ආයතන කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා මණ්ඩල පත්‍රිකාවට අදාල ආයතන කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා නිර්දේශයන්ට 2018 මැයි 16 දින ලැබී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාර ව්‍යාපෘතිය සඳහා වසර තුනක කාල දීර්ඝයක් (2020 දෙසැම්බර් 31 දක්වා) ලබා දී තිබුණි.

2014,2015,2016,2017 හා 2018 වර්ෂ වලදී පිළිවෙලින් රු.659,934 ක් රු. 2,102,258 ක් රු.1,939,829 ක් රු.4,008,902 රු.1,006,031 ක් ලෙස එකතුව රු.9,716,954 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණු අතර මුළු උපයෝජන ප්‍රතිශතය මුළු ශුද්ධ ප්‍රතිපාදනයන් සියයට 5.2 ක් විය. කෙසේ වුවද 2018 නොවැම්බර් 08 දිනැති ලිපියෙන් 2018 ජූලි 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යසාධන හා ඉටුකල කාර්ය භාරය පිළිබඳ තොරතුරු ඉල්ලා සිටියද එය ලබා දී නොතිබු අතර නීති කෙටුම්පත් සම්පාදකගේ අංක LD/Aa/Project/ 2010 (i) හා 2018 දෙසැම්බර් 14 දිනැති ලිපියේ 02,03,04,05,06,07 ඡේදයන්හි සඳහන් කරුණු දැක්වීම මත ව්‍යාපෘතියේ ප්‍රගතිය අඩපණ වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. එසේම ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභා ලේකම්ගේ 2018 දෙසැම්බර් 20 දිනැති අංක Hscc/01/27/Cmvol.II ලිපියේ 2 ඡේදයේ යෝජිත ව්‍යාපෘතිය ඉතා වැදගත් නමුදු රජය වැය කරන මුදලට සාපේක්ෂව අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නම් මෙම ව්‍යාපෘතිය සඳහා නියම වශයෙන් අවශ්‍ය උපදේශකවරුන් සහ සහාය කාර්යමණ්ඩලය හඳුනා ඒ අයට පමණක් ගෙවීම් කිරීමට ක්‍රියාමාර්ගයක් ඇති කිරීම සුදුසු බව ද යෝජනා කර තිබුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880(1) අනුව රජයේ මුදල් ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුචර් සහතික කර චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු අතර, අධිකරණ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ තැන්පත් කළයුතු ඇප මුදල් හා එම ඇප මුදල් ඇප තැන්පත් කළයුතු ආකාරය පිළිබඳව 2011 ජනවාරි 18 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2011 හා 2014 මැයි 07 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2011(1) මඟින් වැඩිදුරටත් දන්වා තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් හත්දෙනෙකු (07) සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.5 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තු අගය රු. 530,250 ක් වූ වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් වාර්තා වී තිබුණි. ඒ සම්බන්ධයෙන් රක්ෂණය මඟින් අය කර ගැනීමෙන් පසු තවදුරටත් අයකර ගත යුතු අලාභය රු. 100,133 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක (i) යටතේ මෙකී අලාභයන් වාර්තා කර නොතිබුණි.

4- යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන විගණන පනතේ 40.1 වගන්තියේ විධිවිධාන ප්‍රකාර අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් එම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණනවරයෙකුද,එම අමාත්‍යාංශය යටතේ ඇති එක් එක් දෙපාර්තමේන්තු සඳහා එහි ගණන්දීමේ නිලධාරියා විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණනවරයෙකු ද පත් කළ යුතු අතර එසේ කටයුතු කර නොතිබුණි.

5 - මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම්

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට අනුමත තථ්‍ය, පුරප්පාඩු හා අතිරේක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. මෙකී කාර්යමණ්ඩලය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 91.7 ක් වැයකර තිබුණි.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	42	29	13
තෘතියක මට්ටම	28	13	15
ද්විතියික මට්ටම	54	40	14
ප්‍රාථමික මට්ටම	24	16	08
එකතුව	**148**	**98**	**50**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ නීති කෙටුම්පත්කරන කාර්යභාරය ඉටුකිරීම සඳහා සෘජුවම දායකත්වය ලබාදෙන කාර්යමණ්ඩලය (ජ්‍යෙෂ්ඨ මට්ටම හා තෘතියක මට්ටම) 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 70 ක් වූ අතර පුරප්පාඩු කාර්ය මණ්ඩලය 28 ක් වූයෙන් එය අනුමත මුළු සංඛ්‍යාවෙන 40% ප්‍රතිශතයක් විය. පසුගිය වර්ෂයේ දීද මෙකී පුරප්පාඩු කාර්යමණ්ඩල ප්‍රතිශතය අනුමත සංඛ්‍යාවෙන් 40% වූයෙන් මෙකි තත්වය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරවන්නක් විය.

තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක	07
සහකාර නීති කෙටුම්පත් සම්පාදක	05
සහකාර අධ්‍යක්ෂ	01
ප්‍රධාන භාෂා පරිවර්තක	01
භාෂා පරිවර්තක	14
	28

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 50 ක් වූයෙන් එය අනුමත සේවක සංඛ්‍යාවෙන් 34% විය. මානව සම්පත් කලමනාකරණයේ කාර්යසාධනය සම්බන්ධයෙන් වූ මෙකී දුර්වලතාවය සමස්ථ ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමේලා වූ කාර්යසාධනය සම්බන්ධයෙන් සෘජුවම බලපෑම් ඇති කරවන්නක් බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

කේ.කේ.වී. ධර්මසිරි

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විවිධ විෂයන් පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වේ. මෙම ක්‍රියාවලියේ දී නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය (amendment) කිරීම, පනත් කෙටුම්පත් ප්‍රතිශෝධනය (consolidation) කිරීම සහ අදාළ අමාත්‍යාංශ ඉදිරිපත් කරනු ලබන උපකාරක නීති පුනරීක්ෂණය (revision) කිරීම ද අවශ්‍ය අවස්ථාවලදී ඒවා නැවත කෙටුම්පත් කිරීම ද සිදු කරනු ලැබේ. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්වලට සහභාගි වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ උපකාරක නීති සැකසීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

'නීති කෙටුම්පත් සම්පාදක අංශය' යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, 2018 වර්ෂයට අදාළව නීති කෙටුම්පත් සම්පාදනය සම්බන්ධව පියවර ගෙන ඇත.

ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගෙන ඇති ක්‍රියා මාර්ග

1. නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියක් නොමැති වීම දීර්ඝ කාලීන ගැටලුවක් විය. එම නිසා, රජයේ ඊ රාජ්‍ය පාලන ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කිරීම සහ මහජනතාව වෙත වැඩි දැනුවත්භාවයක්ලබා දීම පිණිස දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියක් නිර්මාණය කර ප්‍රවර්ධනය කිරීමට අදහස් කරන ලදී.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයක සහාය ඇතිව, දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියක් නිර්මාණය කර නිර්මාණය කරනු ලැබ එම නව වෙබ් අඩවිය දැන් අන්තර්ජාලගත කර ඇති අතර http://ld.gov.lk හරහා එම වෙබ් අඩවියට ප්‍රවේශ විය හැකි ය.

2. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නීති ප්‍රඥප්ති (1956) සහ ලේඛනාගාරය ඩිජිටල්කරණය කිරීම

ලංකාවේ නීති ප්‍රඥප්ති (1956 මුද්‍රණය) සහ එහි උපකාරක නීති නිරන්තරයෙන් පැරණි ඒවා වන අතර පරිහරණය කිරීමේ දී තවදුරටත් පළුදු විය හැකි තත්වයක පවතී. එම නිසා, එම ලේඛන පහසුවෙන් පරිශීලනය කළහැකි වන පරිදි සුරක්ෂිත කළ යුතු වේ. වර්තමානයේ රජයේ ගැසට්පත්‍ර අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළහැකි නමුත්, පැරණි ගැසට්පත්‍ර අන්තර්ජාලයේ නොපවතින අතර පහසුවෙන් ඒ සඳහා ප්‍රවේශ විය නොහැක.

මෙවැනි පසුබිමක් යටතේ, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහාය ඇතිව මෙම දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරයේ පවතින ගැසට් පත්‍ර (මෙහි සෑම ගැසට් පත්‍රයක්ම නොපවතී), සහ පුස්තකාලයේ පවතින නීති ප්‍රඥප්ති (1956) සහ අනෙකුත් අවශ්‍ය පනත් ලේඛනාරක්ෂණය සහ දීර්ඝ කාලීන සංරක්ෂණය සඳහා සුපරීක්ෂණය කර ඩිජිටල්කරණය කිරීම පිණිස ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය.

සේවා සපයන්නකුගේ සේවය යොදවා ගැනීම මගින් දෙපාර්තමේන්තුව විසින් සාර්ථක ලෙස ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇති අතර සක්‍රීය ලෙස සහ කාර්යක්ෂම ලෙස ඩිජිටල්කරණය කරන ලද ලේඛන සොයා බැලීම සහ ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධරයන් විසින් දැන් වෙබ් අඩවිය භාවිත කරමින් සිටියි.

3. West Law දායක වීම

ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී, නීති ක්ෂේත්‍රයේ අලුත්ම ප්‍රවණතාවයක් සම්බන්ධයෙන් දැනුවත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකවරුන්ට අතවශ්‍ය වේ. ඒ සඳහා සම්පත් පැවතීම සහ ඒවා සඳහා පහසුවෙන් ප්‍රවේශවීම ඉතා වැදගත් වේ. එම නිසා, නීති වෘත්තිකයන් සඳහා මාර්ගගත නීති පර්යේෂණ සේවයක් වන West Law සේවය ස්වකීය නිලධරයන්ට ලබා දීමසඳහා අවශ්‍ය අනුමැතිය භාණ්ඩාගාරයෙන් සහ අධිකරණ අමාත්‍යාංශයෙන් ලබන ලදුව එම සේවාව දෙපාර්තමේන්තුව වෙත ලබාගන්නා ලදී.

4. ලංකා රාජ්‍ය ජාලය

දෙපාර්තමේන්තුව ලංකා රාජ්‍ය ජාලය වෙත සම්බන්ධකර ඇත. නිලධරයන් සඳහා ලංකා රාජ්‍ය ජාලයයටතේ වූ නිල ඊමේල් ගිණුම් සාදනු ලැබ ඇත.
තව ද, මෙම දෙපාර්තමේන්තුව ලංකා රාජ්‍ය ජාලය 2.0 සඳහා තෝරාගෙන ඇති අතර මෙම ක්‍රියාවලියේ කොටසක් වශයෙන් වයිෆයි පහසුකම් ලබා දී ඇත.

5. විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ මන්ත්‍රීවරුන් පෞද්ගලිකව ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් කිරීම, හා පනත් සංශෝධන කෙටුම්පත් සඳහා වන ඉල්ලීම් කඩිනමින් සකස් කර භාෂාත්‍රයෙන් ඉදිරිපත් කිරීමට ගත යුතු පියවර පිළිබඳ සියලු නීති නිලධාරීන් නිරතුරුවම දැනුවත් කර ඇත.

6. පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිඟය යම්තාක් දුරට මගහරවා ගැනීමට නීති කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා උපදේශකවරුන් තුන් දෙනෙකු බඳවා ගෙන ඇත.

7. නීති නිලධාරීන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ඉලක්ක කරගත් විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම සඳහා පුළුල් පරාසයක විහිදුනු අවස්ථාවන් ඔවුන්ට ලබා දී තිබේ.

8. දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කොට ඇති 'අ' ශ්‍රේණියේ පුස්තකාලය මගින් දේශීය සහ විදේශීය නීති පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයා දී ඇත.

9. නීති නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලය රාජකාරි වේලාවන්හි දී රාජ්‍ය සේවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි සේවයෙහි නියුතු විය යුතු බවට පැහැදිලි උපදෙස් නිරතුරුව ලබා දෙන අතර නීති නිලධාරීන් මෙන්ම අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල ආදර්ශවත් පරිදි ස්වකීය රාජකාරි කටයුතු ඉටු කරනු ලබන බව ද සඳහන් කළ යුතු ව ඇත.